

## ලියා දන්වන වග යි

### හෘද ශාක්ෂිය විකිණීමට තිබේ

අද දවසේ ශ්‍රී ලාංකේය දේශපාලන ක්ෂෙත්‍රයේ සිදුවෙමින් පවතින්නේ කිසි දා නොවූ විරූ ආකාරයේ හාස්‍යජනක හා පුගුප්සාජනක රංගනයකි. තමාගේ හෘද ශාක්ෂියට එකඟ නොවන යමක් තම පක්ෂයෙන් සිදුවෙයි නම් එයට එරෙහිව ඉවත්ව යාම අමුතු දෙයක් නොවේ. නමුත් අද සිදුවන්නේ හෘද ශාක්ෂියට එකඟව වැඩ කිරීමට වඩා හෘද ශාක්ෂිය මිලකට විකිනීම නොවේ ද?

ඇති බලය රැකගන්නටත් නැති බලය ලැබ ගන්නටත් දෙපාර්ශවයම හරි හරියට මන්ත්‍රීවරුන් බිලි බා ගැනීමේ ව්‍යාපාරයේ නිරත වනු අපට පෙනෙයි. මන්ත්‍රී හාමුදුරු-වරුන්ටවත් මේ ව්‍යසනයෙන් ගැළවී සිටින්නට අපහසු තරම් බව උන්වහන්සේලා කරන ප්‍රකාශ වලින් පෙනෙයි.

යුද උන්මාදය විසින් ඇස් අන්ධ කරනු ලැබූ සමාජයක මෙයටත් වඩා දෙයක් සිදුවුණද කටක් ඇර කියන කිසිවකු නැති වීම පුදුමයක් නොවේ.

මේ රංගනය තව කොපමණ කළක් නිහඬව බලා සිටින්නට ශ්‍රී ලාංකිකයනට සිදුවේ ද?

### අපට වෘත්තිය මට්ටමේ ක්‍රිකට් ක්‍රීඩකයන් නැද්ද?

මේ කතා කරන්නට යන්නේ ජය පරාජය ගැන නොවේ. ජය පැරදුම පිළිබඳව ප්‍රශ්නයක් නැත. අපේ ක්‍රිකට් ක්‍රීඩකයන් වෘත්තිය මට්ටමේ ක්‍රීඩකයන් ලෙස සැළකිය හැකි ද? මේ ප්‍රශ්නය අසන්නේ අප පමණක් නොවේ. ශ්‍රී ලංකා ක්‍රීඩකයන් ක්‍රීඩා කරන විලාසය දකින බොහෝ අය මේ ප්‍රශ්නය අසති.

ඔස්ට්‍රේලියානු ක්‍රීඩකයන් මේ තරම් තරගකාරී වන්නේ ක්‍රීඩාව කෙරෙහි ඔවුන් තුළ ඇති කැපවීම නිසා ය. මේ කැපවීම අපේ ක්‍රීඩකයන් ගේ ඉරියව් තුළින් විද්‍යාමාන නොවීමේ රහස කුමක් ද?

ඔස්ට්‍රේලියානු ක්‍රීඩකයන් කොයි තරම් කඩිසර ද? ඔවුන් ගේ පන්දු යවන්නෙක් ගන්න. එක් පන්දුවක් යවා අනෙක් පන්දුව යවන්නට ඔවුන් ඇවිද යන්නේ කෙතරම් කඩිසරව ද? මේ කඩිසර බව අපේ එක ක්‍රීඩයකු හෝ ප්‍රදර්ශනය නොකරන්නේ මන්ද? ඔවුන් ක්‍රීඩා පිටිය තුළ හැසිරෙන්නේ කොයි තරම් අලස ස්වභාවයකින් ද? මේ අලස හැසිරීම දකින නරඹන්නන්ට දැනෙන අපුල කොයි තරම් ද? ප්‍රතිවාදීන් සිත් සසළ කරවන අන්දමේ ක්‍රීඩා ශීලීත්වයක් ඔස්ට්‍රේලියානුවන් ප්‍රදර්ශනය කරන්නේ මේ කඩිසර බව තුළින් ම නොවේ ද?

තරග දිනීමට මහන්සි වීම පසෙක තිබියදී කණ්ඩායමේ තරගකාරී ආකල්ප වර්ධනය කෙරෙහි අවධානයක් යොමු කිරීම වැදගත් නොවේ ද? පෞරුෂ වර්ධනය පුහුණුවට අදාල කරුණක් නොවේ ද? වෘත්තීය මට්ටමේ ක්‍රීඩකයන් බිහි නොකර අන්තර්ජාතික තලයේ මේ තරම් හෑල්ලුවට ලක්වීම ශ්‍රී ලාංකිකයන් හැටියට අපට වේදනාවකි. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ බලධාරීන්ට නම් ඒ ගැන වගේ වගක් නැති බව ඉතා පැහැදිලි ය.

මාවන්ට හුරේ දමන්නට සිතක් අපට ද පහළ වන්නේ එනිසා ය.

### ඉල් විරු සමරුව

සැම වසරකම පුරුද්දට වාගේ 1989 වසරේ ඉල්මහ දී දිවි පිදූ තරුණ තරුණියන් සැමරෙයි. අවාසනාවට මෙය තවත් එක සැමරුමක් විනා ඉන් ඔබ්බට ගොස් ඒ දිවි පිදූවනට සාධාරණයක් ඉටුකෙරෙන ව්‍යාපාරයක් බවට පත් කරන්නට අදාල ඇත්තන්ට කල්පනා නොවෙයි. 89 භීෂණය හේතුවෙන් දූ පුතුන් අහිමි වූ දෙමාපියන්, දෙමාපියන් අහිමි වූ දරුවන් කී දෙනෙක් තවමත් දුක් විඳිමින් සිටිනවා ද? බලය නැති කළ මේ අසරණයන් වෙනුවෙන් කිඹුල් කඳුළු හෙළණ දේශපාලකයන් බලය ලද පසුවත් ඒ ගැන වගේ වගක් නැතිව සිටිය හා සිටින අකාරය දකින විට ඇති වන්නේ කණගාටුවකි.

සන්නස

සෑම මාසයකම 15 වන දා නිකුත් වෙයි






### ඉල් මහේ සිතුවිලි

නිල් නුබ තලාවෙන් හෙමිහිට බිමට බැස
විල් මත පිපෙන මහනෙල් මල් මතට ඉස
ඉල් මහ වලාහක දෙව්දුනි ඔබගෙ ඇස
මෙල්බන් පුරය වෙත යොමු වන විටය යස

තුරුමත විහඟ කැළ පිණිබිඳු සලා වී
විසිතුරු රටාවට උන් පියසලා වී
දරු සූරතලුන් දුව පැන මල් නෙලා වී
ඒ මල් සුවඳ රට සැම තැන ගලා වී

රණ සුරයන් පිළිබඳ යුදබිම මැරුණු
මුළු ලොව පුරා පවසයි පොපි මල් පිපුණු
මිනිසා වෙතින් මතුවන සිතිවිලි දරුණු
මේ ඉල්මහේ සිහිපත් කළ යුතු කරුණු

ජගත් වෙත්තසිංහ

### කවි කොළය

යුද බිම සටන් කරවන ලොකු ලොක්කන්ට
ඉල්ලා අස්වෙන්න කිව්වලු විපක්සයෙන්
හොඳහැටි හිතා බැලුවම එම පරකාසේ
පිළිබඳ අපේ අය දොස් පවරනු නරකයි

කොටි සංවිධානෙට දැන් සිදුවන හරිය
බැලුවම පුදුම වී ඒ උත්තම ඇත්තෝ
වැඩ බැරි එකා ඉල්ලා අස්වෙනු කියලා
කොටි නායකට ළඟදිම පවසනු සත්තයි

වෙත්තසිංහ

සන්නස

**සංස්කරණය/Editor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සංස්කරණ සහය/Asst. Editors**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage
අසෝක සුබසිංහ Asoka Subasinghe

**තාක්ෂණ සහය**
දසුන් ගජමන් Dasun Gajaman

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandta Eeriyagama

**TAS**
Anura Seneviratne
03 6327 4259

**Sannasa**
22 Lorne Street
Lalor Vic 3075 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

### සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.